# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2010 අංක 15 දරන භාණ්ඩාගාර ලේකම් (නියෝජිතයකු නම් කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 දෙසැම්බර් මස 10 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2010 අංක 15 දරන භාණ්ඩාගාර ලේකම් (නියෝජිතයකු නම් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]

එල්. ඩී.—ඕ. 34/2010.

**යම් නීති ප්‍රඥප්තියක් මගින් පිහිටුවන ලද යම් කමිටුවක, අධිකාරියක, මණ්ඩලයක හෝ ආයතනයක සාමාජිකයකු ලෙස භාණ්ඩාගාර ලේකම්වරයා පත්කිරීමට එකී නීති ප්‍රඥප්තිය මගින් විධිවිධාන සලසා ඇති අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ යම් දෙපාර්තමේන්තුවකින් තැනැත්තකු භාණ්ඩාගාර ලේකම්වරයා විසින් තම නියෝජිතයකු ලෙස නම් කිරීමට ද ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

යම් නීති ප්‍රඥප්තියක් මගින් ඇති කරන ලද හෝ පිහිටුවන ලද හෝ යම් කමිටුවක, අධිකාරියක, මණ්ඩලයක හෝ ආයතනයක සාමාජිකයකු ලෙස එම නීති ප්‍රඥප්තිය මගින් භාණ්ඩාගාර ලේකම්වරයා පත්කරනු ලැබීම සිරිතක් වශයෙන් පැවැති බැවින් ද : පූර්විකාව.

භාණ්ඩාගාර ලේකම්වරයාගේ ධුරය ප්‍රකාරව ඔහු විසින් ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට නියමව ඇති විවිධ බලතල හා කර්තව්‍ය හේතුකොටගෙන භාණ්ඩාගාර ලේකම්වරයාගේ කාලය බෙහෙවින් සීමාවීම හේතුකොටගෙන එවැනි සෑම කමිටුවක, අධිකාරියක, මණ්ඩලයක හෝ ආයතනයක සාමාජිකයකු වශයෙන් භාණ්ඩාගාර ලේකම්වරයාට එම රැස්වීම්වලට සහභාගීවීම ඉතා දුෂ්කර කාර්යයක් වී ඇති බැවින් ද :

එවැනි කමිටුවක, අධිකාරියක, මණ්ඩලයක හෝ ආයතනයක ඔහුගේ නියෝජිතයා වශයෙන් යම් තැනැත්තකු නම් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට හැකිවනු පිණිස නීතිමය විධිවිධාන සැදීම අවශ්‍ය වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2010 අංක 15 දරන භාණ්ඩාගාර ලේකම් (නියෝජිතයකු නම් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

භාණ්ඩාගාර ලේකම්වරයාට ඔහු වෙනුවට නියෝජිතයකු නම් කිරීමට හිමිකම් ඇතිබව.

**2.** අවස්ථාවෝචිත පරිදි යම් කමිටුවක, අධිකාරියක, මණ්ඩලයක හෝ ආයතනයක සාමාජිකයකු ලෙස භාණ්ඩාගාර ලේකම්වරයා පත් කරනු ලැබීමට හෝ නම් කරනු ලැබීමට තත් කාලයේ බලපවත්නා යම් නීතියක් මගින් විධිවිධාන සලසා ඇති අවස්ථාවක, එම කමිටුවේ, අධිකාරියේ, මණ්ඩලයේ හෝ ආයතනයේ තම නියෝජිතයා වශයෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ යම් දෙපාර්තමේන්තුවකින් සුදුසු තැනැත්තකු නම් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට හිමිකම් ඇත :

එසේ වුව ද, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලයේ රැස්වීම්වලට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ මුදල් කොමිෂන් සභාවේ රැස්වීම්වලට භාණ්ඩාගාර ලේකම්වරයා සහභාගි විය යුතු ය.

නම් කිරීම වලංගුවීම.

**3.** මේ පනත ක්‍රියාත්මකවීමට පෙර යම් අවස්ථාවක භාණ්ඩාගාර ලේකම්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි යම් කමිටුවක, අධිකාරියක, මණ්ඩලයක හෝ ආයතනයක තම නියෝජිතයා වශයෙන් යම් තැනැත්තකු නම් කර ඇති අවස්ථාවක එම නම් කිරීම වලංගු හා බලාත්මක විය යුතු අතර, එම නම් කිරීම මේ පනත ප්‍රකාරව කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.